**බස්නාහිර පළාත් සභාව - 2020 වර්ෂය**
**-----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**---------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

බස්නාහිර පළාත් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2021 දෙසැම්බර් 12 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 පෙබරවාරි 09 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නව පළාත් සභා ගොඩනැගිල්ල සඳහා මිලදීගත් රු. 557,984,598 ක වත්කම් 2019 ඔක්තෝබර් 02 දිනැති අංක 09/2019 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ මූල්‍ය චක්‍රලේඛයේ 3.1 වගන්තිය පරිදි 2019 නොවැම්බර් 30 දිනට පෙර පළාත් සභාව යටතේ වන ආයතන වෙත ලිඛිතව භාරදීමට කටයුතු කළ යුතු අතර ඒවා භාරගැනීමේදී ලැබෙන නිකුත් නියෝග පදනම් කරගෙන ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර ලැබීම් නියෝග නිකුත් කළ යුතුව තිබුණි. නමුත් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය, ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය සහ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය විසින් ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඉංජිනේරු කාර්යාංශය විසින් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.557,984,598 ක් මුදලින් ගෙවා මිලදී ගන්නා ලද වත්කම්වලට අදාළව ඒ ආකාරයට නිකුත් නියෝග හෝ ලැබීම් නියෝග නිකුත් කර නොතිබුණි. එහෙයින් ඉහත වත්කම් බස්නාහිර පළාත් සභාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය සහ තොරතුරු තාක්‍ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය මගින් තොරතුරු විමසා ඇති අතර, එම තොරතුරු ලද පසු මෙම වර්ෂයේදී ඉදිරි කටයුතු කරන බව දන්වමි. | ප්‍රධාන ලේකම්ගේ මූල්‍ය චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව අදාළ වත්කම් ඉන්වෙන්ට්‍රි ලේඛනවලට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 හා 07 වගන්ති සහ 2019 මාර්තු 01 දිනැති අංක 03/2019 දරන බස්නාහිර පළාත් මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාර 2019 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. නමුත් ඉංජිනේරු කාර්යාංශයේ රු.6,069,989,056 ක්වූ වත්කම් තක්සේරු කර අදාළ නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර එලෙස තක්සේරු නොකිරීම හේතුවෙන් නිවැරදි වටිනාකම් ගිණුම්වලටද ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේදී අදාළ තක්සේරු කිරීම සිදු කර ගිණුම්වලට ඇතුළත් කර ගැනීමට සටහන් කර ගෙන ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් කර වර්ෂ 02 ඉක්මවූ නමුත් නියාදනය නොකළ, අමාත්‍යාංශ 02 ක, දෙපාර්තමේන්තු 09 ක, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක හා කොමිෂන් සභාවක එකතුව රු.64,472,590 ක්වූ තැන්පතු ශේෂ 581 ක් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරවුල් නොකළ තැන්පත් ගිණුම් ශේෂ 2021 වර්ෂය තුළදී නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්ට හා ගණන්දීමේ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පතු ශේෂ සම්බන්ධව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ පිරිවැය රු.7,502,574 ක්වූ මූල්‍ය නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු නොකිරීමෙන් වත්කම්වල සත්‍ය වටිනාකම ගිණුම්වලින් නිරූපණය වී නොතිබුණි. | රු.6,579,182 වටිනාකමක් ඇති ජංගම නොවන වත්කම් නැවත අගය කිරීමක් සිදුකරන ලදී. | තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතුය. |
| (ඉ) | බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රු.230,917,360 ක අග්‍රිම ශේෂය 2021 ජූලි 12 දින වනවිටත් බස්නාහිර පළාත් භාණ්ඩාගාරයට නිරවුල් කර නොතිබුණි. | නොපියවූ අග්‍රිම ශේෂය හැකි ඉක්මනින් පියවා අවසන් කරන ලෙස සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී ඇත. | නොපියවූ අග්‍රිම ශේෂය නොපමාව පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ රු.21,801,471 ක ප්‍රේෂණ ශේෂය 2021 ජූලි 12 දින වනවිටත් බස්නාහිර පළාත් භාණ්ඩාගාරයට පියවා නොතිබුණි. | ප්‍රේෂණ ශේෂය හැකි ඉක්මනින් පියවා අවසන් කරන ලෙස සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී ඇත. | ප්‍රේෂණ ශේෂය නොපමාව පියවීමට කටයුතු කළ යුතුය. |
| (උ) | බස්නාහිර පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරන නමුත් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 06/2018 දරන 2018 පෙබරවාරි 26 දිනැති | අදහස් දක්වා නොමැත. | මෝටර් රථයේ අයිතිය පවරාගෙන නිවැරදි වත්කම් කාණ්ඩයේ ගිණුම්ගත කිරීමට |

| | | | |
|---|---|---|---|
| | මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට කටයුතු නොකළ, ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි මෝටර් රථයක වටිනාකම වූ රු.3,400,000 ක් එම දෙපාර්තමේන්තුවේ දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | | කටයුතු කළ යුතුය. |
| (ඍ) | ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2020 ජනවාරි 21 දින පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිකුත් කරන ලද රු.1,480,000 ක් වටිනා බහාළුම (Container Cabin) 2020 ඔක්තෝබර් 14 වන දින අමාත්‍යාංශය විසින් භාරගෙන ලැබීම් සහතික නිකුත් කර තිබුණු නමුත් එම වටිනාකම අමාත්‍යාංශයේ ගිණුම්ගත කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය යටතේ ඇති ආයතනවලට අනුයුක්ත කර ඇති වාහන 46 ක් තක්සේරු කර නිවැරදි වටිනාකම ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එම නිසා වත්කම් තුළ නිවැරදි වාහන වටිනාකම පෙන්නුම් කිරීමට නොහැකි වී තිබුණි. | 2021 වර්ෂයට අදාළ අවසන් ගිණුම් සකස් කිරීමේදී මෙම වාහන තක්සේරු කර එහි අගයන් ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල දැනුවත් කර ඇත. | වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලේකම් කාර්යාලය සතුව වාහන 32 ක් පැවති අතර එම වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

**1.5 ශීර්ෂ 104 - පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය (බ.ප.)**

**1.5.1 බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තියේ 19(1) වගන්තිය ප්‍රකාරව කාර්යාංශ ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට, බලාත්මක කිරීමට හා ගාස්තු අයකිරීමට ප්‍රධාන විධායක නිලධාරී විසින් රීති සකස් කර ආණ්ඩුකාරවරයා වෙතින් අනුමත කරවාගත යුතු වුවත් එවැනි රීති සකස් කර නොතිබුණි. | මූලා රීති කෙටුම්පත් කිරීමේ අවසන් අදියරෙහි පවතී. | ප්‍රඥප්තිය ප්‍රකාරව නොපමාව රීති සකස් කර ආණ්ඩුකාරවර අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත තුළ කෘෂිකාර්මික, කාර්මික, වාණිජ හා වෙළඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උත්පාදන ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම, පිහිටුවීම හා එම කාර්යයන්හි නිරතවීම සඳහා සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කටයුතු සිදුකිරීමේ කාර්ය සඳහා කාර්යාංශය පිහිටුවා තිබුණි. එම කටයුතු ඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකිරීම උදෙසා කාර්යාංශය වෙත සමාලෝචිත වර්ෂය තුළදී පළාත් පාලන අමාත්‍යාංශයෙන් (බ.ප.) ලැබුණු රු.20,000,000 ක ප්‍රාග්ධන ප්‍රදාන වර්ෂය අවසානය වනවිටත් කිසිදු කටයුත්තකට උපයෝජනය කර නොතිබුණි. | එම මුදල් යොදවාගෙන වෙස්ප්‍රෝ මුද්‍රණාලය සඳහා ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා තවත් මුදල් ප්‍රතිපාදන හිඟ බැවින් එම හිඟ මුදල් ද සපයා ගන්නා තුරු කාලීන තැන්පතු අයෝජනයෙහිම පවත්වා ගැනීමට අපේක්ෂිතය. | ප්‍රාග්ධන ප්‍රදානය උපයෝජනය කර එමගින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට කාර්යාංශය යටතේ පවතින "වෙස්ප්‍රෝ" ආරක්ෂක සේවය මඟින් සපයන ලද සේවයට විවිධ ආයතනවලින් රු.11,747,533 ක් අයවිය යුතුව තිබුණි. එසේම 2015 මාර්තු 25 දින හෝමාගම ප්‍රාදේශීය සභාවේ අබලි භාණ්ඩ ගබඩාව ගිනිගෙන විනාශවීම හේතුවෙන් සභාවට සිදුවී තිබුණු රු.2,117,441 ක අලාභය "වෙස්ප්‍රෝ" ආරක්ෂක සේවය, ප්‍රාදේශීය සභාව වෙත සේවා සැපයීම වෙනුවෙන් 2019 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා මාසවලට කරන ගෙවීම්වලින් අඩුකර ගැනීමට ප්‍රාදේශීය සභාව තීරණය කර තිබුණි. ඒ අනුව රු.2,103,249 ක් 2019 සැප්තැම්බර් සිට දෙසැම්බර් මාසවල බිල්පත්වලින් අඩුකර ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය හා හෝමාගම ප්‍රාදේශීය සභාව අතර ඇති වූ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව තීරකයෙකු වෙත යොමු නොකර සභාව විසින් ඒකපාක්ෂිකව මෙම මුදල් කාර්යාංශය වෙත නොගෙවා රඳවාගෙන තිබුණි. කාර්යාංශය විසින්ද මෙම මුදල අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 මාර්තු 22 දින ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරී වෙත කරුණු දක්වා ලිපි යොමු කර ඇත. | කාර්යාංශය විසින් තීරකයකු වෙත යොමු කර මෙම මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට "වෙස්ප්‍රෝ" ආරක්ෂක අංශයේ සේවකයන්ගෙන් නිල ඇඳුම් ණය (Uniform Loans) සඳහා අයවිය යුතු ශේෂය රු.1,088,057 ක් වූ අතර එම ශේෂය තුළ 2011 සහ 2012 වර්ෂවලදී සේවය හැර ගිය සේවකයන්ගෙන් අයවිය යුතු රු.777,227 ක්ද ඇතුළත්ව තිබුණි. | 2012/2013 වර්ෂයන්ට අදාළව පවතින රු.777,227 ක ශේෂය ගිණුම් පොත් වලින් ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී. | නිල ඇඳුම් ණය කාලීනව අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ඉ) | කාර්යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම, කාර්යාංශයේ විධායක නිලධාරී ඇතුළු ඉහළ කළමනාකාරිත්වයේ වගකීමක් සහ රාජකාරියේම කොටසක් විය යුතුය. නමුත් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය අවසානය දක්වා "වෙස්ප්‍රෝ" ආරක්ෂක අංශ ව්‍යාපෘතියෙන් ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු නිලධාරීන් 04 දෙනෙකුට ව්‍යාපෘති අධීක්ෂණ දීමනාවක් ලෙස රු.2,245,000 ක් ගෙවා තිබුණි. පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් 2013 වර්ෂයේ සිට ඉන්ධන දීමනාවක් ලෙස ගෙවූ මෙම දීමනාව 2018 මාර්තු මස සිට ව්‍යාපෘති අධීක්ෂණ දීමනාව ලෙස දීමනා නාමය වෙනස් කර ගෙවා තිබුණි. | බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රඥප්තියේ (15,ඈ) සාමාන්‍ය බලතල යටතේ, කාර්යාංශයේ සේවකයන්ගේ පාරිශ්‍රමික ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරී ඇත. | දීමනා ගෙවීමට අදාළ නිසි අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | "වෙස්ප්‍රෝ" කාර්යාලීය පරිශ්‍ර ආශ්‍රිත සෞඛ්‍ය සේවා ව්‍යාපෘතියේ සේවාවන් සැපයීම වෙනුවෙන් ව්‍යාපෘති දීමනාවක් ලෙස 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය අවසානය දක්වා ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු කාර්යාංශයේ නිලධාරීන් 17 දෙනෙකුට නීතිමය ප්‍රතිපාදනයක් නොමැතිව රු.3,911,710 ක් ගෙවා තිබුණි. | බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රඥප්තියේ (15,ඇ) සාමාන්‍ය බලතල යටතේ, කාර්යාංශයේ සේවකයන්ගේ පාරිශ්‍රමික ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරී ඇත. | දීමනා ගෙවීමට අදාළ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. (පළාත් සභාව විසුරුවා හැර ඇති නිසා) |

### 1.5.2 බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සංචාරක මණ්ඩලය විසින් නිකුත් කර තිබූ සඟරා වෙළුම් 17 කට අදාළව ලැබිය යුතු සඟරා ආදායම රු.5,572,200 ක් සහ 2013 වර්ෂයේ සිට පැවත එන රු.776,282 ක ලැබිය යුතු ශේෂයක් සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අදාළ හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් ආණ්ඩුකාරතුමා වෙත යැවීමට සූදානම් කර ඇත. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මණ්ඩලය සඳහා 2019 සැප්තැම්බර් 30 දිනැති කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියක් මඟින් කාර්ය මණ්ඩලය 15 දෙනෙකු අනුමත කර තිබුණි. එසේ වුවත් මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කරවා ගෙන | බඳවා ගැනීම් පටිපාටි මේ දක්වා අනුමත වී නොමැත. අනුමැතිය ලැබෙන තුරු මණ්ඩලයේ කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා අදාළ නිලධාරීන් යොදාගෙන ඇති බව දන්වමි. | බඳවා ගැනීමේ පටිපාටි සකස් කර නොපමාව අනුමත කරවාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබීම හේතුවෙන් එම කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකි වී තිබුණු අතර වර්තමාන කාර්ය මණ්ඩලය වැඩ බලන තනතුරු 06 කින් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද තනතුරු 09 කින් සමන්විත විය. | | |
| (ඇ) | මණ්ඩලයේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන කළමනාකරණ සහකාර නිලධාරීන් 08 දෙනෙකු සහ වැඩ බලන කළමනාකරණ සහකාර නිලධාරීන් 04 දෙනෙකු පත්කර තිබුණි. මණ්ඩලය සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සහකාර තනතුරු 03 ක් පමණක් පැවතීම මත 09 දෙනෙකු අතිරික්තව සේවයේ යොදවා තිබුණි. | සේවා අවශ්‍යතාවය මත ආරම්භයේදී මෙම නිලධාරීන් බඳවාගෙන ඇතත් 2020 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 03 ක් පමණක් අනුමත කර ඇත. | අනුමත කර ඇති කාර්ය මණ්ඩලය පමණක් සේවයේ යෙදවිය යුතුය. |

**1.6 ශීර්ෂ 106 - කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය**

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 08, 09 වගන්ති හා 2018 මාර්තු 16 දිනැති අංක CSO/ADM/18/38/01/01-2018 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපිය ප්‍රකාරව විශ්‍රාමිකයෙකු නැවත සේවයට බඳවා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු | 2020 අගෝස්තු 24 දින සිට කොන්ත්‍රාත් පදනම මත පත් කර තිබුණු නිලධාරියා සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශයන් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය හෝ ලබා ගෙන නොතිබුණි. | අදාළ පත්වීම නීත්‍යානුකූල නොවූ පත්වීමක් සේ සලකා ක්‍රියාකළ යුතුය. |

ප්‍රධානීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ආකෘති පත්‍රය ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ ලබාගත යුතුය. නමුත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර සත්ත්ව නිෂ්පාදන, සෞඛ්‍ය හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා 2020 අගෝස්තු 24 දින සිට කොන්ත්‍රාත් පදනම මත පත් කර තිබුණු නිලධාරියා සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය ලබා ගෙන නොතිබුණි.

## 1.6.1 කෘෂි සේවා අධිකාරිය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 හා 2020 වර්ෂවලදී බස්නාහිර පළාත තුළ කෘෂිකාර්මික නිෂ්පාදන ඇසුරුම්කරණය, අගය එකතු කිරීම හා ඒ සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා කෘෂි සේවා අධිකාරිය විසින් රු.2,000,000 ක් වටිනා ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. ව්‍යාපෘති වාර්තාව අනුව, මිලට ගෙන තිබූ උපකරණ, ගිවිසුම් මඟින් සමිති වෙත පරිහරණ අයිතිය ලබාදී ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ප්‍රජා සේවා මධ්‍යස්ථානවල ස්ථාපිත කර තෝරාගනු ලබන කණ්ඩායම්වලට ලබාදීමට කටයුතු කරන බව දක්වා තිබුණද ඊට පටහැනිව එම උපකරණ මීගමුවේ, පිටිපන ජලජීවී මධ්‍යස්ථානය වෙත භාරදී තිබුණි. පසුව පිටිපන ජලජීවී මධ්‍යස්ථානය වෙත | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

භාරගත් උපකරණවල විවිධ ගැටළු පැන නැඟී ඇති බැවින් ආපසු අධිකාරිය වෙත භාර දී තිබුණි.

**1.7 ශීර්ෂ 107 - මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය**

---

**1.7.1 පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් පවරා ගැනීමකින් තොරව කැළණිය දක්ෂිණ මාර්ගය සංවර්ධනය කිරීම හේතුවෙන් බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව ඉඩම් හිමියන් විසින් පවරා තිබුණු නඩුවල තීන්දු මත රු.111,419,945 ක් වන්දි ලෙස ගෙවීමට තීන්දුවී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට එයින් රු.89,011,500 ක් ගෙවා තිබුණි. | 2011 වසරේ එම ඉඩම් කොටස්වල තක්සේරු වටිනාකම් ලබා ගනිමින් මෙම වන්දි මුදල ගෙවීම් කරන ලද බව සඳහන් කරමි. | නිලධාරීන්ගේ නොසැලකිල්ලක් මත වන්දි ගෙවීමට සිදුවීද යන්න සොයා බැලීම සඳහා පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (ආ) | විවිධ ව්‍යාපෘති හා කාර්යයන් සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අමතරව පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තදුවිත පදනම යටතේ සේවකයින් 408 ක් හා කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයින් 146 ක් වශයෙන් අධිකාරියේ කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා | මෙම කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව සඳහන් කරමි. | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් බඳවා ගැනීම සිදු නොකළ යුතුය. |

සේවකයින් 554 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණු අතර මිනිස්බල සැලැස්මක් සකස්කර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

### 1.7.2 කර්මාන්ත සංවර්ධන අධිකාරිය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ග අඩි 7,800 ක ප්‍රමාණයකින් යුත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටි ගොඩනැගිල්ල 2020 වර්ෂය වන විට රු.3,360,000 ක් වූ වාර්ෂික බදු කුලී පදනමෙන් පවත්වාගෙන යනු ලබයි. එම ගොඩනැගිල්ලේ වර්ග අඩි 750 ක පමණ ප්‍රමාණයක් 2015 වර්ෂයේ සිට අධිකාරිය විසින් භාවිතයට ගෙන නොතිබුණු අතර එම කොටසෙහි වර්ග අඩි ප්‍රමාණය මත 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ගෙවන ලද බදු කුලිය රු.1,759,423 ක් වී තිබුණි. 2015 ජනවාරි මාසයේ සිට නිෂ්කාර්යව පවතින එම කොටස ඵලදායී කාර්යයක් සඳහා යොදවා ගැනීමට 2021 මාර්තු 31 දක්වා කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිෂ්කාර්යව පවතින කොටස ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.8 ශීර්ෂ 108 - අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිර්ඝ කාලයක සිට පැවත එන අධ්‍යාපන අමාත්‍යාංශයේ වාහන 03 කට අනතුරු වීමෙන් සිදු වූ අලාභය සහ රූපවාහිනී යන්ත්‍රයක් නැති වීම සම්බන්ධයෙන් අයවිය යුතු මුදල වූ රු.3,295,634 ක අලාභයන් සඳහා බස්නාහිර පළාත් මූල්‍ය රීති 54.1.6 ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ගෙන් හානිය පූර්ණය කරගැනීමට හෝ විධිමත් අනුමැතිය සහිතව පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.8.1 බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,675,150 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පවතින රු.147,275 ක් හා වර්ෂ 03 සිට 05 අතර කාලයක සිට අය නොවී පවතින රු.435,325 ක්ද ඇතුළත්ව තිබුණි. | අදහස් දක්වා නොමැත. | ශේෂ අයකර ගැනීමට හෝ අයකළ නොහැකි නම් වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2017 අංක 01 දරන බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ 9(3), 9(4) හා 9(5) වගන්තිවල දැක්වෙන පරිදි | කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය යටතේ අධිකාරිය සතුව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් | ප්‍රඥප්තියේ වගන්ති ප්‍රකාරව අධිකාරිය විසින් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කළමනාකරණ මෘදුකාංගය සකස් කිරීම වෙනුවට අධිකාරිය විසින් 2018 වර්ෂයේදී රු.3,756,750 ක් වැයකර බස්නාහිර පළාත් සභා නව කාර්යාල සංකීර්ණයට පැමිණිලි කළමනාකරණ පද්ධතියක් පෞද්ගලික ආයතනයකින් මිලදීගෙන ස්ථාපිත කර තිබුණි. | විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ සැපයුම්කරුවන් තෝරාගෙන ඇත. | |

**1.8.2 සෞන්දර්ය නිකේතන පාලන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල රු.5,350,000 ක වටිනාකමට ගිණුම්ගත කර තිබුණු ඩබල් කැබ් රථයේ සහ ත්‍රිවීල් රථයේ අයිතිය බස්නාහිර පළාත් මාර්ග අමාත්‍යාංශයෙන් පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අධිකාරිය යටතේ ගිණුම්ගත කර ඇති වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.9 ශීර්ෂ 109 - ප්‍රධාන ලේකම් කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදය ප්‍රකාරව නිලධාරීන්ට මාසිකව නිවාස දීමනාවක් ගෙවිය නොහැකි වුවත් 2017 නොවැම්බර් සිට 2020 දෙසැම්බර් මාසය දක්වා පළාත් සභාවේ නිලධාරීන් 19 දෙනෙකු සඳහා රු.12,417,000 ක නිල නිවාස දීමනාවක් ගෙවා තිබුණි. | පළාත් සභා පනතේ 32(3) වගන්තියේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියද සහිතව ගරු ආණ්ඩුකාරවරයා විසින් ලබාදී ඇති අනුමැතිය ප්‍රකාරව ගෙවීම් සිදුකරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.2, 4.2.3, 4.5, 4.6 හා 6.3 වගන්ති ප්‍රකාරව ආයතන 06 ක මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් හෝ සේවකයන් වෙත ලබාදෙන ලද ණය අත්තිකාරම් රු.1,868,511 ක ශේෂයක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් පාරිතෝෂිතයෙන් අයකර දෙන ලෙසට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දැනුම්දී ඇති අතර විශ්‍රාම වැටුප් හිමි නැති මියගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් අදාළ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතුය. |
| (ඇ) | 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.V වගන්තිය ප්‍රකාරව විශ්‍රාමිකයෙකු නැවත සේවයේ යොදවනු ලබන කාල සීමාව තුළ දී ආයතන ප්‍රධානියා විසින් සුදුසු අනුප්‍රාප්තිකයෙකු හඳුනා ගනු ලැබිය යුතු අතර, එම නිලධාරියා පුහුණු කිරීමේ කාර්යය නැවත සේවයේ යොදවනු ලබන විශ්‍රාමික නිලධාරියාගේ වගකීමක් වශයෙන් ඔහුට පැවරිය යුතුය. නමුත් පළාත් පාලන ආයතන 03 ක නිලධාරීන් 08 දෙනෙකු අවුරුදු 02 සිට 05 දක්වා කාලයක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණද සුදුසු නිලධාරියෙකු පුහුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | අදාළ කාල සීමාව තුළ දී නිලධාරියෙකු පුහුණු කිරීමට යටත්ව නැවත සේවයේ යෙදිය යුතු බවට නිර්දේශ ලබා දී ඇත. එසේ වුව ද පවතින විශාල පුරප්පාඩු සංඛ්‍යාව, පලපුරුදු නිලධාරීන්ගේ හිඟකම හා සේවයේ අවශ්‍යතාවය යන කරුණු මත අදාළ කොන්ත්‍රාත් පත්වීම් ලබා දී ඇති අතර හැකි සෑම අවස්ථාවකම වැඩ බැලීමේ පත්වීම් ලබා දීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 වගන්තිය සහ 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(අ) වගන්තිය ප්‍රකාරව නිලධාරියෙකු හෝ සේවකයෙකු මාරුවී පැමිණ මාස 02 ක් ගතවීමෙන් පසු හෝ මාරුවී ගොස් මාස 03 ක් ගතවීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය අත්තිකාරම් ශේෂ නොපැවතිය යුතු වුවත්, ආයතන 06 ක වසරකට වැඩි කාලයක සිට අයවිය යුතු රු.2,889,923 ක ණය ශේෂයන් පැවතුණි. | පළාත් පාලන ආයතන වෙත ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් මාසික වාරික වශයෙන් පියවන නිසා මෙසේ නිරවුල් නොවූ ණය ශේෂයන් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2019 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2019 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ 5.III වගන්තිය ප්‍රකාරව සියලුම දීප ව්‍යාප්ත සේවා තනතුරු සඳහා පත්වීම් බලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වන බැවින් පළාත් සභාව තුළ පවතින දීප ව්‍යාප්ත සේවාවලට අයත් තනතුරු සඳහා විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යෙදවීමේදී ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. නමුත් අදාළ අනුමැතියෙන් තොරව කොළඹ මහා නගර සභාවේ ගණකාධිකාරී තනතුරු 07 ක්, තවත් පළාත් පාලන ආයතන 05 | පුරප්පාඩු පිළිබඳව වරින් වර රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් දැනුවත් කළ නමුත් එම පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් පළාත් සභාව වෙත ලබා දී නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක ගණකාධිකාරී තනතුරු 05 ක් සහ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් තනතුරු 01 ක් වශයෙන් නිලධාරීන් 13 දෙනෙකු ආණ්ඩුකාරවරයා විසින් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. | | |
| (ඊ) | ආදායම් සංකේත 05 ක තථ්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා වැඩි අගයක් ගෙන තිබූ අතර එහි විචලනය සියයට 16 සිට සියයට 388 දක්වා පරාසයක පැවතුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රමාණවත් සැලකිල්ලකින් වඩාත් නිවැරදි ලෙස ආදායම් ඇස්තමේන්තු කළ යුතුය. |
| (උ) | ආදායම් සංකේත 13 ක තථ්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩු අගයක් ගෙන තිබූ අතර එහි විචලනය සියයට 25 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | 2020 වර්ෂයේ ඇතිවූ කොවිඩ් වසංගත තත්වය යටතේ රට මුළුමනින්ම වසා දැමීම නිසා සමස්ත ආර්ථිකයට ඇති වූ අවාසිදායක තත්වය මත ඇස්තමේන්තුගත ආදායම් ඉලක්කයන් කරා ලඟාවිය නොහැකි වූ බව පෙන්වා දෙමි. | ඇස්තමේන්තුගත ආදායම ලඟා කරගත නොහැකි වේ නම් ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ආදායම් සංකේත 15 ක ආදායම් රැස්කිරීම සියයට 24 සිට 352 දක්වා පහත වැටී තිබුණි. | කොවිඩ් වසංගත තත්වය යටතේ රට මුළුමනින්ම වසා දැමීම නිසා සමස්ත ආර්ථිකයට ඇති වූ අවාසිදායක තත්වය මත ඇස්තමේන්තු ගත ආදායම් ඉලක්කයන් කරා ලඟාවිය නොහැකි විය. | ඇස්තමේන්තුගත ආදායම ලඟා කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | ආදායම් ගණන්දීමේ නිලධාරීන් තිදෙනෙකු විසින් ඒ ඒ ආයතනවල ආදායම් සංකේත 05 ක් යටතේ අය විය යුතුව තිබුණු රු.76,569,423 ක් වූ ආදායම් සමාලෝචිත වර්ෂය තුළදී පොත්වලින් ලියා හැර තිබුණි. | තැපැල් හා උසාවි කටයුතු හැර ඇති ගිවිසුම් ගාස්තු ඇතුළු මුද්දර ගාස්තු පළාත් මූල්‍ය රීති 116-1 යටතේ අයකර ගත නොහැකි බවට සෑහීමකට පත්වූ පසු, අර්ධ වාර්ෂිකව පවත්වනු ලබන නියෝජ්‍ය කොමසාරිස් කමිටුව විසින් ගනු ලැබූ තීරණයක් පරිදි එම හිඟ ශේෂයන් කපා හැරීම සිදුකර ඇත.<br>පිරිවැටුම් බදු සියලු සාක්ෂි පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසු කපා හැර ඇත. | නීති මාර්ගයෙන් හෝ වෙනත් මාර්ගවලින් හෝ හිඟ මුදල් අය කර ගැනීමට නොහැකි බව තහවුරු වන ණය ශේෂ පමණක් කපා හැරිය යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේදී ආදායම් සංකේත 30 ක් යටතේ ආදායම් රැස්කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වනවිට එයින් ආදායම් සංකේත 17 කට අදාළව රු.11,279,032,524 ක හිඟ ආදායමක් පැවතුණි. | පවත්නා කොවිඩ් වසංගත තත්වය යටතේ ආදායම් එකතු කිරීම සඳහා පවත්නා යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් දිගින් දිගටම ආදායම් එකතු කරගැනීමේ අපහසුතා පැවති බව හා මේවන විටත් පවතින බව පෙන්වා දෙමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බදු දී ඇති ඉඩම් 17කට අදාළව වාර්ෂික බලපත්‍ර ගාස්තු වශයෙන් රු.500,853 ක්ද ඊට අදාළ දඩ වශයෙන් රු.170,392 ක්ද අයවීමට තිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ බදු හා දඩ මුදල් අයකර ගැනීමට හෝ අයකළ නොහැකි නම් බදුකරුවන්ට එරෙහිව නීති |

| | | | |
|---|---|---|---|
| | තවද, දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී ඇති ඉඩම් 03ක් වෙනුවෙන් හිඟ බදු මුදල් ලෙස රු.3,021,122 ක්ද ඊට අදාළ දඩ වශයෙන් රු.98,560 ක්ද 2020 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබුණි. | | ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඕ) | ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝකාලීන බදු වශයෙන් ලබා දී ඇති ඉඩම් 08 කට අදාළව බදු හා දඩ වශයෙන් රු.3,566,080 ක් අය විය යුතුව තිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ බදු හා දඩ මුදල් අයකර ගැනීමට හෝ අයකළ නොහැකි නම් බදුකරුවන්ට එරෙහිව නීති ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ක) | මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝකාලීන බදු වශයෙන් ලබාදී ඇති ඉඩම් 2 කට අදාළව 2007 සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව රු.7,528,250 ක බදු මුදලක් අය විය යුතුව තිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ බදු හා දඩ මුදල් අයකර ගැනීමට හෝ අයකළ නොහැකි නම් බදුකරුවන්ට එරෙහිව නීති ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ග) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමුපකාර සමිතියක් වෙත 1974 ජනවාරි 01 දින වසර 30 ක බදුකාලයක් සඳහා ඉඩමක් බදු දී තිබුණු අතර 2004 වර්ෂයේදී බදු කාලය අවසන් වීමෙන් පසුව නැවත 2012 වර්ෂයේදී නව හඳුනා ගැනීමක් ලෙස එම සමිතියටම බදු දීම සඳහා කටයුතු ආරම්භ කර තිබුණි. අදාළ ඉඩමේ ප්‍රමාණය | අදහස් දක්වා නොමැත. | විධිමත් පරිදි ඉඩම් බදු දී නියමිත බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු තොරතුරුවල පරස්පරතාවයක් පිළිබඳව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් 2016 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලා තිබූ තොරතුරු 2021 පෙබරවාරි 05 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව වසර 30 ක බදු කාලය අවසන් වීමෙන් පසුව අඛණ්ඩව එම සමිතිය විසින් අදාළ ඉඩම වසර 16 කට වඩා අධික කාලයක් බදු නොගෙවා පරිහරණය කරන බව නිරීක්ෂණය විය. | | |
| (ච) | කටාන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ රජයේ ඉඩම් පර්චස් 622ක් වන බිම් කොටස් 05ක පදිංචි පවුල් 35ක් වසර 20කට වඩා අධික කාලයක සිට දීමනා පත්‍රයක් හෝ නොමැතිව සිටින බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | බදු දීමට හෝ දීමනා පත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ජ) | අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 14 ක් විසින් 2020 දෙසැම්බර් 31 දින වනවිට අය කරගත යුතුව තිබුණු අලාභ හානි වටිනාකම රු.59,187,542 ක් විය. | එක් ආයතනයක් පමණක් අදහස් දක්වා තිබුණි. | අලාභ හානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.10 ශීර්ෂ 110 - ඉංජිනේරු කාර්යාංශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් මූල්‍ය රීති 471.1 ප්‍රකාරව මිලදීගත් සියලුම භාණ්ඩ බඩු ලේඛන පොත්වල ලැබීම් පැත්තේ ඇතුළත් කළ යුතු නමුත් 2018 සිට 2020 වර්ෂය දක්වා කාලය තුළදී පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.115,000,000 කට මිලට ගත් ශ්‍රව්‍ය සම්මන්ත්‍රණ සාකච්ඡා (Audio Conferencing) පද්ධතිය සභා ලේකම් කාර්යාලයට භාරදී ඇතත් ඊට අදාළ නිකුත් කිරීම් සහ ලැබීම් නියෝග හුවමාරු කර නොගැනීම හේතුවෙන් සභා ලේකම් කාර්යාලයේ බඩු ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. | 2018 සිට 2020 දක්වා මිලට ගත් Audio Conferencing පද්ධතිය බඩු ලේඛන පොත්වලට ඇතුළත් කිරීමට හෝ නිකුත් කිරීම් / ලැබීම් නියෝග මඟින් භාණ්ඩ භාවිතා කරනු ලබන සභා ලේකම් කාර්යාලයේ බඩු ලේඛනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත් සභාවේ සභා ගර්භයට පළාත් ඉංජිනේරු කාර්යාංශය විසින් රු.මිලියන 115 ක සන්නිවේදන උපකරණ පද්ධතියක් ප්‍රසම්පාදනය කර තිබුණි. පිළියෙල කර තිබුණු මූලික වැඩ ප්‍රමාණන පත්‍රය අනුව ඩෙලිගේට් ඒකක (Delegate units) 145 ක් ප්‍රසම්පාදනය කළ බව දක්වා තිබුණු නමුත් සවිකර තිබූ ඒකක සංඛ්‍යාව 110 ක් බැවින් ඒකක 35 ක් වෙනුවෙන් එකක් | මෙම මිලදී ගැනීමට අදාළ තීරණ හා ප්‍රසම්පාදන කටයුතු සභා ලේකම් කාර්යාලය විසින් සිදුකර නොමැති බව දන්වමි. | පරීක්ෂණයක් සිදුකර වගකිව යුත්තන් තීරණය කර වැඩිපුර ගෙවීම අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.498,031 බැගින් රු.17,431,085 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි. එමෙන්ම සභාවේ යෝජනා සඳහා ඡන්ද විමසීම සිදු කළ යුතු මුළු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව මන්ත්‍රීවරු 104 ක් නමුත් ඡන්දය ලබාදීමේ උපාංග (Voting Units) එකක් රු.83,105 ක් බැගින් ඒකක 40 ක් වැඩිපුර මිලදී ගැනීමෙන් රු.3,324,200 ක මතභේදාත්මක වැයක් දරා තිබුණි. එමෙන්ම අවශ්‍යතාවය ඉක්මවා අමතරව මිලදීගෙන තිබුණු තවත් උපකරණ අයිතම 1,058 ක් අභාවිතව ගබඩා තුළ තබා තිබුණු අතර ඒවායේ වගකීම් කාලය සහ යාවත්කාලීනව භාවිතා කිරීමේ හැකියාව යල් පනිමින් පැවතුණි. | | |
| (ඇ) | බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශය විසින් 2018 වර්ෂයේදී මිලදීගෙන තිබුණු ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා මෘදුකාංග සංවර්ධන යනාදී එකතුව රු.මිලියන 557.98 ක්වූ වත්කම් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් ලේඛනගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතී. | මිලදීගත් වත්කම් වහාම ලේඛනගත කළ යුතුය. |
| (ඇ) | ඉංජිනේරු කාර්යාංශයේ ඉංජිනේරු තනතුරු 08 ක්, තෘතීය මට්ටමේ තාක්ෂණික නිලධාරී තනතුරු 14 ක්, සැලසුම් ශිල්පී | අදහස් දක්වා නොමැත. | පුරප්පාඩු පිරවිය යුතුය. |

තනතුරු 09 ක්, තාක්ෂණික නිලධාරී (QS) තනතුරු 02 ක්, තාක්ෂණික නිලධාරී සිවිල් තනතුරු 15 ක් සහ තාක්ෂණික සහායක තනතුරු 04 ක් පුරප්පාඩු පැවති අතර අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී තිබුණි.

## 1.11 ශීර්ෂ 112 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් මාසය දක්වා අවස්ථා 03 කදී රු.14,025,573 ක් වැය කර LED පුවරු 06 ක් ප්‍රසම්පාදනය කර තිබුණු අතර එයින් 2016 දෙසැම්බර් 30 දින රු.4,328,370 ක් වටිනා පුවරු 03 ක් මිලට ගැනීම සඳහා පළාත් මූල්‍ය රීති 416.1 හා 2006 ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය අනුව ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර නොතිබුණි. ඉහත පුවරු 06 න් 03 ක්ම මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින අතර අනෙක් පුවරු 03 ද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. මූල්‍ය රීති 431 ප්‍රකාරව ගිවිසුම්වලට එළඹ නොතිබීම හේතුවෙන් අක්‍රිය පුවරු සක්‍රීය කරවා ගැනීමට නොහැකි වී තිබුණි. | 2017 වර්ෂයේදී මිලදීගත් LED පුවරු පළාත් මූල්‍ය රීති 416.1 හා 2006 ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයට අනුව ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කර මිලට ගෙන ඇත. | මූල්‍ය රීති හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.122,976,348 ක්වූ වත්කම් නිවැරදි ලෙස ලේඛනගත කර නොතිබුණි. | ඉදිරියේදී යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වමි. | වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ පිහිටි පළාත් පාලන බල මණ්ඩල 49 ක හිඟ ආදායම රු.7,295,160,138 ක් විය. | 2021 මාර්තු 31 දක්වා අයකිරීම් ඉදිරිපත් කර තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මහා නගර සභා 04 ක සහ ප්‍රාදේශීය සභා 02 ක නිලධාරීන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර 25 කට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු වටිනාකම රු.32,682,530 ක් විය. | අයවිය යුතු ශේෂය ඉදිරිපත් කර තිබුණි. | අධිභාර මුදල් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | පළාත් පාලන බල මණ්ඩලවල පවත්නා අඩුපාඩු පිළිබඳව 2020 දෙසැම්බර් 31 දින දක්වා පළාත් පාලන ආයතන 14 කට නිකුත් කර තිබූ විගණන විමසුම් 64 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | විගණන විමසුම් සඳහා නොපමාව පිළිතුරු ඉදිරිපත් කළ යුතුය. |

**1.12 ශීර්ෂ 113 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගම්පහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ තිබුණු ගිලන් රථ 03 ක්, කැබ් රථයක්, ජීප් රථයක් හා ත්‍රීරෝද රථයක් වසර 01 සිට වසර 05 කට වැඩි කාලයක් භාවිතයට ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | භාවිතයට ගෙන නොතිබූ වාහන භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පාදුක්ක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල පිහිටි ඉඩම 2017 අප්‍රේල් 27 දින රු.24,000,000 ක තක්සේරු වටිනාකමකට තක්සේරු කර අත්පත්කර ගැනීමේ නිවේදනය ගැසට් කර තිබුණු නමුත් 2021 ජූලි 05 දින වන විටත් මෙම ඉඩම එහි පෞද්ගලික හිමිකරු වෙතින් අත්පත් කරගෙන නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ කටයුතු පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදු කරමින් පවතී. | ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |

**1.13 ශීර්ෂ 115 - සමාජ සේවා දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පළාත් සහා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ අවම බැර සීමාව රු.9,000,000 ක් වුවද, සත්‍ය බැර ශේෂය රු.8,920,722 ක් පමණක් විය. | මින් ඉදිරියට මෙවැනි සිදුවීම් සිදුනොවීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස සියලුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ට සහ ගණන් දීමේ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සීමා ලඟා කරගත නොහැකි නම් සීමා සංශෝධනය කරගත යුතුය. |

## 1.14 ශීර්ෂ 118 - ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් පුද්ගලික ආයතනයකට දීර්ඝකාලීනව බදු ලබා දී ඇති හෙක්ටයාර් 1.163 ක ඉඩම සඳහා වූ බදු කාලය 2020 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වී තිබුණු අතර මෙම ඉඩමේ භුක්තිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නැවත භාර දී තිබුණි. එම ආයතනය විසින් 2006 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා මෙම ඉඩම භුක්ති විඳිම වෙනුවෙන් රු.31,216,249 ක හිඟ බදු මුදලක් අයවීමට තිබූ අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙම හිඟ බදු මුදල් අයකර ගෙන නොතිබුණි. | මෙම අයකිරීම සම්බන්ධව දිගින් දිගටම ක්‍රියා කරමින් පවතී. | හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.15 ශීර්ෂ 123 - ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් රු.8,631,583 ක් ගෙවා ව්‍යාපාර ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා මෘදුකාංගයක් 2020 ජුනි 16 දින මිලදී ගෙන තිබුණි. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මෘදුකාංගයට තොරතුරු ඇතුළත් කිරීමට ප්‍රවේශ වීමේ පහසුකම ලබා දී නොතිබීම හේතුවෙන් 2021 මාර්තු 19 දින වනවිටත් මෘදුකාංගය මිල දී ගැනීමේ අරමුණ ඉටු වී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මෘදුකාංගය මිලදී ගැනීමේදී අරමුණු ඉටු කළ යුතුය. |

**1.16 ශීර්ෂ 126 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 1,940 ක ඇස්තමේන්තු වටිනාකමකට වූ යෝජනා 1,099 ක් අනුමත කර තිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ. | | |
| **(i)** මිනුවන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 07ක අඩක් ඉදිකර, ඉදිකිරීම් නවතා තිබූ පාසල් ගොඩනැඟිලි පවතින අතර එම ගොඩනැඟිලිවල වැඩ නිම කිරීම සඳහා අවශ්‍ය මුදල රු.88,000,000ක් ලෙස ඇස්තමේන්තු කර, 2020 වාර්ෂික සංවර්ධන සැලැස්මට ඇතුළත් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී ඊට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගෙන එම ගොඩනැඟිලිවල වැඩ නිම කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අඩක් ඉදිකර, ඉදිකිරීම් නවතා දමා ඇති ගොඩනැගිලිවල ඉදිකිරීම් නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** බප/මිනු දාගොන්න මෙතෝදිස්ත ප්‍රාථමික විද්‍යාලයේ කඩා ඉවත්කිරීම සඳහා නියමිත ගොඩනැඟිල්ල වෙනුවට රු.මිලියන 15ක ඇස්තමේන්තුවකට අනුව නව දෙමහල් ගොඩනැඟිල්ලක් | අදහස් දක්වා නොමැත. | වාර්ෂික සංවර්ධන සැලැස්මට ඇතුළත් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබාදීම පිණිස 2020 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්මට ඇතුළත් කර තිබුණු නමුත් එය ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| | **(iii)** කැළණිය අධ්‍යාපන බල ප්‍රදේශයේ අඩක් නිමකළ ගොඩනැඟිලි 25ක් සඳහා රු.248,653,070 ක වියදමක් දරා ඇති අතර එම ගොඩනැඟිලිවල ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා රු.221,166,540 ක් අවශ්‍යව තිබුණි. එම අඩක් ඉදිකළ ගොඩනැඟිලි තවදුරටත් නිම නොකිරීම මත එම ගොඩනැඟිලි වෙනුවෙන් දැරීමට වන අනාගත පිරිවැය ඉහළ යාමත් නොනිමි ගොඩනැගිලි අව්වට සහ වැස්සට නිරාවරණය වීම නිසා හානියට පත්වීමත් නිරීක්ෂණය කෙරේ. | අදහස් දක්වා නොමැත. | අඩක් ඉදිකර, ඉදිකිරීම් නවතා දමා ඇති ගොඩනැගිලිවල ඉදිකිරීම් නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මීගමුව කලාප අධ්‍යාපන බල ප්‍රදේශය සඳහා “ලඟම පාසැල හොඳම පාසැල” ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 13 ක් සඳහා රු.283,400,000 ක් වෙන් කර තිබුණි. එම මුදලින් පාසල් 07 ක ගොඩනැඟිලි සම්පූර්ණයෙන් නිමකර ඇති නමුත් ගොඩනැඟිලි 06ක් නිමකිරීමේ ප්‍රතිශත සියයට 25 සිට සියයට 90 දක්වා පරාසයක පැවතුණි. මෙම ගොඩනැඟිලිවලින් පාසල් 03 ක රු.20,474,232 ක් වියදම් දරා ඉදි කරන ලද ගොඩනැඟිලි 4ක් | ඉදිකිරීම් නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ටෙන්ඩර් කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉදිකිරීම අතරමග නවතා දමා තිබුණි. | | |
| (ඇ) | මීගමුව කලාප අධ්‍යාපන කාර්යාල බල ප්‍රදේශයේ 2013 වර්ෂයේ සිට ඉදිකිරීම් ආරම්භ කරන ලද ගොඩනැඟිලි 16 ක වැඩ අවසන් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉදිකිරීම් සඳහා දරන ලද වියදම රු.332,325,018 ක් විය. ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා තවත් රු.99,300,000 ක් අවශ්‍ය බව ඇස්තමේන්තු කර තිබුණි. | පළාත් අමාත්‍යාංශ මට්ටමින් සංවර්ධන සැලැස්මේ ඉහළම ප්‍රමුඛතාවය සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගෙන ඇත. | අතිරේක ප්‍රාග්ධන ලබාගෙන වැඩ නිම කර ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | මීගමුව කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් ළඟම පාසල හොඳම පාසල කිරීමේ සංකල්පය යටතේ 2017 වර්ෂයේදී ජා-ඇල හෝලිරොසරි මහා විද්‍යාලයේ භෝජනාගාරය සහ ගුරු නේවාසිකාගාරයක් ඉදිකිරීම ආරම්භකර රු.6,929,991 ක වියදමක් දරා වහල දක්වා නිමකිරීමෙන් පසුව ඉදිකිරීම් නවතා දමා තිබුණි. එමෙන්ම අඩක් නිමකළ තවත් ගොඩනැඟිලි දෙකක් පවතින මෙම පාසලේ ප්‍රාථමික අංශය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ගොඩනැඟිලි නොමැති නිසා මීටර් 800 ක් දුරින් පිහිටි කතෝලික දේවස්ථානයක ප්‍රාථමික අංශයේ පන්ති පැවැත්වෙන බව නිරීක්ෂණය විය. | මෙම ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන මෙන් ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘති අධ්‍යක්ෂ දැනුවත් කිරීම සඳහා කටයුතු කර ඇත. | ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මෙම ව්‍යාපෘතීන් එලෙස අතර මග නවතා දැමීම තුළින් පාසල අනාරක්ෂිත වීම, යකඩ කම්බි දිරාපත්වීම, පාසල් දේපළවලට හානි සිදුවීම හා ඩෙංගු රෝගය ව්‍යාප්තවීම වැනි අවධානම් සහගත පරිසරයක් නිර්මාණයවීම හා ගොඩනැඟිලි පහසුකම් අවම වීම නිසා ප්‍රාථමික අංශ සිසුන්ටද විවිධ අපහසුතාවයන්ට මුහුණපෑමට සිදුවී තිබුණි. | | |
| (ඉ) | මීගමුව කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ 2017 මාර්තු 06 දින වැඩ ආරම්භ කරන ලද ශාන්ත සෙබස්තියන් මහා විද්‍යාලයේ දෙමහල් තාක්ෂණ විද්‍යාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වැඩ 2018 අගෝස්තු 04 දින සිට නවතා දමා තිබුණි. රු.22,860,962 ක වියදම් දරා අඩක් ඉදිකළ මෙම ගොඩනැඟිල්ල වසර දෙකකට ආසන්න කාලයක් පරිසරයට නිරාවරණය වී තිබීම නිසා යකඩ කම්බි මලකඩ කමින් දිරාපත් වෙමින් පවතින බව 2020 සැප්තැම්බර් 28 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ඉදිකිරීම් නැවත ආරම්භ කිරීම සඳහා ටෙන්ඩර් කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇත. | වැඩ ආරම්භ කර ඇති ඉදිකිරීම් කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාලය සතුව පළාත් සභා පාසල් නිල නිවාස 11 ක් තිබෙන අතර ඉන් 04 ක් අලුත්වැඩියා කළ යුතු තත්වයක පවතින බවත් 02 ක් භාවිතයට ගත නොහැකි හා දිරාපත්වෙමින් පවතින බවත් නිරීක්ෂණය විය. | නිල නිවාස 04 ක් අළුත්වැඩියා සිදු කරමින් පවතින බවත් 01 ක් කඩා ඉවත් කිරීමේ විධිමත් ක්‍රියාමාර්ග ගනිමින් පවතින බවත් දන්වා සිටිමි. | පාසල් නිල නිවාස භාවිතයට ගත යුතුය. |
| (උ) | මිනුවන්ගොඩ කලාපයේ අවධානම් සහිත ඉතා හදිසි වහල අළුත්වැඩියාවන් කළ යුතු ගොඩනැඟිලි පවතින බව නිරීක්ෂණය වූ අතර පාසල් 21 ක් අතුරින් පාසල් 19 ක එවැනි අවදානම් සහිත ගොඩනැඟිලි තුළ සිසු දරුවන් අධ්‍යාපන කටයුතු වල නිරත වී සිටින බවත් පාසල් 02 ක වහල කඩා වැටී තිබුණු බවත් නිරීක්ෂණය විය. අවදානම් සහිත වහල අලුත්වැඩියාව සඳහා රු.100,500,000 ක දළ ඇස්තමේන්තු සකස් කර 2020 වර්ෂයේ සංවර්ධන සැලැස්මටද ඇතුළත් කර තිබුණු නමුත් මෙම පාසල්වල වහල අලුත්වැඩියාව සිදුකර නොතිබුණි. | ගොඩනැගිලි 04 ක් මේ වනවිට අළුත්වැඩියාවන් සිදුකර අවසන් අතර ඉතිරි පාසල් පොරොත්තු ලේඛනයට ඇතුළත් කර ඇත. | අවධානම් සහිත ඉතා හදිසි අළුත්වැඩියාවන් කඩිනමින් සිදු කළ යුතුය. |
| (ඌ) | පසුගිය දශක දෙකක කාලපරිච්ඡේදය තුළදී ගම්පහ කලාප අධ්‍යාපන බල ප්‍රදේශය තුළ ඇති පාසල්වලින් ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීම හේතු කරගෙන වසා දැමූ පාසල් සංඛ්‍යාව 15 ක් විය. | වසා දැමූ පාසල් 14 ක් මේ වනවිට ප්‍රාදේශීය ලේකම් වෙත භාරදී ඇත. | ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කළ යුතුවේ. එසේ කළ නොහැකි නම් පමණක් |

| | | | |
|---|---|---|---|
| | | | වෙනත් කාර්යයක් සඳහා යොදාගත යුතුය. |
| (එ) | පසුගිය දශක දෙකක කාලපරිච්ඡේදය තුළ දී මීගමුව කලාප අධ්‍යාපන බල ප්‍රදේශ තුළ ඇති පාසල්වලින් වසා දැමූ පාසල් 12 ක් පැවති අතර එයින් පාසල් 04 ක් වෙනත් පාසලකට ඒකාබද්ධ කර තිබුණි. ඉතිරි පාසැල් 08ක් සම්පූර්ණයෙන්ම වසා දමා එයින් පාසල් 04 ක් විවිධ ආයතන සහ ආගමික ස්ථානවලට පවරා තිබුණි. | එම විද්‍යාලයේම කණිෂ්ඨ විද්‍යාලයට හෝ මහා විද්‍යාලයට ඒකාබද්ධ කර ඇත. පාසල් 03 ක් කතෝලික සභාවට අයත් බැවින් සභාව වෙත පවරා ඇත. | ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කළ යුතුවේ. එසේ කළ නොහැකි නම් පමණක් වෙනත් කාර්යයක් සඳහා යොදාගත යුතුය. |
| (ඒ) | මිනු/ හුණුමුල්ල මහා විද්‍යාලයේ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරය උසස් පෙළ පන්ති පැවැත්වෙන පාසල් සඳහා ලබා දෙන Type 01 වර්ගයේ තාක්ෂණික විද්‍යාගාරයක් වුවත් මෙම පාසලේ උසස් පෙළ පන්ති නොපැවැත්වෙන බැවින් Type 01 තාක්ෂණික විද්‍යාගාරයක අවශ්‍යතාවයක් නොතිබුණු බව නිරීක්ෂණය විය. මෙම තාක්ෂණික විද්‍යාගාරයේ රසායන විද්‍යා හා භෞතික විද්‍යා විද්‍යාගාර (Chemistry Lab හා Physics/Mathematics Lab) සඳහා වෙන්කර තිබුණු බිම්මහල වර්තමානයේ 6-11 ශ්‍රේණි සඳහා ගණිතාගාරය වශයෙන් | විද්‍යාගාරය මේ වනවිට විවෘත කර ඇත. අවශ්‍ය උපකරණ සැපයීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | විද්‍යාගාරයට අවශ්‍ය උපකරණ කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පවත්වාගෙන යනු ලබන අතර භාෂා විද්‍යාගාරය (Language Lab) හා තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය (Information Technology Lab) වශයෙන් වර්ග කර තිබුණු උඩුමහල එම විද්‍යාගාර සඳහා ලබාදීමට නියමිතව තිබුණු පරිගණක පුටු 60ක් සහ පරිගණක 62 ක් ඇතුළු උපාංග 216 ක් ලබා නොදීම හේතුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා යොදවා ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ඔ) | මිනුවන්ගොඩ කලාප අධ්‍යාපන බල ප්‍රදේශය තුළ වර්තමානයේ ශිෂ්‍ය සංඛ්‍යාව 100 ට අඩු පාසල් 31 ක් පවතින බවත් 1996 වර්ෂයේ සිට ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීම නිසා වසා දැමූ පාසල් ගණන 15 ක් බවත් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කළ යුතුවේ. එසේ කළ නොහැකි නම් පමණක් වෙනත් කාර්යයක් සඳහා යොදාගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,170,517,374 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,441,053,486 ක් විය. ඒ අනුව අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,611,570,860 ක වර්ධනයක් ඇති වී තිබුණු අතර එම වර්ධනය සඳහා බදු ආදායම පූර්ව වර්ෂයට සාපේක්ෂව රු.19,664,203,127 කින් අඩු වුවත් රජයේ පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රු.27,593,250,000 කින් වැඩිවීම හේතුවී තිබුණි.